# ඩයස්පෝරාව පාවා දුන් හෝරාව

**රනත් කුමාරසිංහ**



රජයේ වියදම් අඩු කිරීම හා අදායම් වැඩි කිරීම මගින් අය වැය හිඟය ජාතික ආදායමෙන් 5% කට ගෙන ඒම කොන්දේසි ගත කර, රඳවනු ලැබ තිබූ තම ණය මුදලේ තුන්වන කාර්තුව නිදහස් කිරීමට IMF ය තීරණය කර තිබෙන බව අද වාර්තා විය.

මේ තීන්දුව අප ඉදිරියේ වැදගත් ප්‍රවනතා තුනක ඒකාබද්ධවීමක් පෙන්නුම් කරන්නේ යයි මට සිතේ. ආණ්ඩුව දහසකුත් එකක් වහසිබස් මේ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලට එරෙහිව දෙඩුවද, අවසාන වශයෙන් අදාල කොන්දේසි ඉටු කරමින් තිබීම පළමුවෙන් පෙනී යන සාධකයයි. ඒ අනුව කවුරුත් දන්නා පරිදි පසුගිය සතිය - දෙක තුළ අත්‍යාවශ්‍ය පාරිභෝගික භාණ්ඩ රැසකම බදු ඉහළ දමන ලදී. වාහන, අධිමිල රූපවාහිනී යන්ත්‍ර, විදුලි උපකරණ වලට විශාල ලෙස බදු අඩු කර, පාන් පිටි, කිරි පිටි, ටින්මාළු ඇතුළු සාමාන්‍ය ජනතාවගේ ආහාර ද්‍රව්‍ය වල බදු ඉහළ දමනු ලැබුවා හා සමඟම ආණ්ඩුවේ ප්‍රකාශකයින් තමන්ට IMF ණයේ තුන්වන වාරිකය වහාම ලැබෙන බවට ප්‍රකාශ කර සිටියහ. ඉන් පෙනී යන්නේ දුගියාගෙන් රේක්ක කර ධනපතියාට සහන සැලසීමත් සමඟ වැඩේ කෙරෙන බවට IMF ට සහතික වී සිටි බවයි. ඒ අතර අතර සේවා අංශ සඳහා විසර්ජන කෙටුම්පතේ වෙන් කර ඇත්තේ සොච්චමකි. උදාහරණයක් ලෙස අධ්‍යාපනය සඳහා රුපියල් කෝටි 2700 ක් වෙන් කරත්දී, ණය ගෙවීමට කෝටි 80,000 ක් වෙන් කර තිබේ. ආරක්ෂක වියදම කෝටි 20,000 කි. දන් පැහැදිලිය. ණය ගෙවීමේ වගකීම ආණ්ඩුව නිසි ලෙස බාරගෙන තිබේ. දෙමළ විමුක්ති අරගලය ඝාතනය කර ස්ථාවර කළ ධනපති රාජ්‍යය ඉනුදු නොනැවතී තවත් ශක්තිමත් කර ප්‍රාග්ධනයේ ආරක්ෂාව ස්ථිර කිරීම සඳහා මුදල් එසේ වෙන් කර තිබේ. (අද සිට පසුගිය මාස 12 ක් එනම් වසරක් ගත් කල 50,000 කට වැඩි පිරිසක් හමුදා වලට අළුතින් බඳවාගෙන ඇති බව වාර්තාවේ. මේ වියදම් ඔවුන්ගේ නඩත්තුව සමඟය.)

ඒ අතර ඉංදියාව සමග 'සීපා ගිවිසුම' අත්සන් නොකිරීම එසේ තිබියදී, ඉංදියාවේ ආධිපත්‍යය තුළ ක්‍රියා කරන බවට සහතික වෙමින් ඒ සඳහා අත්‍යාවශ්‍ය පොරොන්දු දී මහින්ද රාජපක්ෂ තම ඉන්දීය ගමනේදී සියලු එකඟතාවයන් පල කර තිබේ. මහින්ද රාජපක්ෂගේ ජූලි 08-11 ඉංදීය නිල සංචාරය හමාරයේ ප්‍රකාශයට පත් කර ඇති ඒකාබද්ධ ප්‍රකාශය සිහිකල්පනාවෙන් කියවන ඕනෑම අයකුට මේ ගැන විචිකිච්චාවක් තිබිය නොහැකිය. එහි දී ආර්ථික, සමාජීය, සංස්කෘතික, ආගමික, පරිපාලන ආදී මෙකී නොකී සෑම පැත්තකින්ම එකඟතා ඇති කරගෙන හමාරය. මේ ඒකාබද්ධ ප්‍රකාශය කියවන්නෙකුට දෙමළ ජනතාවගේ නිජ බිම් ප්‍රදේශ සම්බන්ධයෙන් සියලු තීරණ ගැනීමේ අයිතිය ඉංදියාවට පැවරීමට මහින්ද රාජපක්ෂ එකඟ වී ඇතැයි සිතෙන තරමිය. ගෝලීය ධනවාදයේ සැනසීමට මේ ඒකාබද්ධ ප්‍රකාශය ඉතාම වටනේ ය. තමන්ගේ දකුණු ආසියාතු නියෝජිතයා ට කීකරුව වැඩ කිරීමට ලංකාව එකඟ වී තිබේ. IMF හි පෙරකී තීරණයට එය වැදගත් සාධකයක් වූවා නිසැකය.

ඒ අතර මෙම එකඟතාවයන්ට සමපාතව දෙමළ ඩයස්පෝරාවේ වර්ධනයන් මෙහිදී තවත් තීරණාත්මක සාධකයක්ව තිබෙන බව පැහැදිලිය. විමුක්ති කොටි සංවිධානයේ යුදමය පරාජය, දෙමළ ඊලාම් ස්වරාජ්‍ය සඳහා වූ අරගලයේ, ඊට වඩා අඩු ලංසුවට ගෙන සැලකුව හොත් ස්වයංතීරණය හා ස්වපාලනය සඳහා වූ දෙමළ ජනතාවගේ අරගලයේ නිමාව ලෙස චිත්‍රණය කෙරිණි. ප්‍රායෝගිකව බලන කල ලක් භූමිය තුළ ජීවත් වන දෙමළ ජනතාව මේ යුදමය පරාජය තුළ දවැන්ත පසුබෑමකට ලක් වූවා සත්තය. ඔවුන්ගේ නිදහස් අරගලය විලාපයක් බවට පත් විය. ආත්ම විශ්වාසය පමණක් නොව ආත්ම ගෞරවයත් තිරශ්චීන ලෙස පාගා දමනු ලැබිණි. විජාතික හමුදා පාලනයකට යටත් කළ භූමියක වෙසෙන ජනතාවක, කාන්තා සාමාජිකයන් ගේ ඉරණම ගැන කියනුම කවරේ ද? කාන්තාවගේ ගෞරවය වලපල්ලට ගිය තැනක කුමන නම් ආත්ම ගෞරවයක් ද? දෙමළකම, විමුක්ති කොටි සාමාජික සාමාජිකාවන්ගේත්, දස දහස් සංඛ්‍යාත ඔවුන්ගේ මා පිය ඥාති හිතමිත්‍රාදීන්ගේත්, රුහිරු ගංගාවන් හි ගසාගෙන ගියා සේ සැලකිනි. කොටින් කියතොත් ජාතියක් ජන්මයක් නැති හුදු මානවයන් පිරිසක් බවට උතුරේ දෙමළ ජනතාව පත් වී හමාර වූ ලෙසක් ද මොහොතකට දිස් විය.

නමුත් මේ තත්වයට එරෙහිව හඬ නැගුනේ විදෙස් ගත ලාංකික දෙමළ ප්‍රජාවේ දරු මුණුපුරන් වන්නා වූ දෙමළ ඩයස්පෝරාව වෙතිනි. ඔවුන් දෙමළ කම, තමන්ගේ නිජබිම, තමන්ගේ ලක්වාසී ඥාතිහිතමිත්‍රාදීන්ගේ ජාතික උරුමය වෙනුවෙන් හඬ නගනු අපි දුටිමු. ලංකාවේ නිෂ්පාදිත භාණ්ඩ වර්ජනයක් සංවිධානය කරන බවද ඇසීමු. විශේෂයෙන් යුරෝපා සංගමයේ GSP + බදු සහනය අත්හිටුවීම වෙනුවෙන් මේ ඩයස්පෝරාව වැදගත් වැඩ කොටසක් ඉටු කළ බව නොදන්නෙක් නැත.

ඒ සියල්ල එසේ තිබිය දී පසුගිය දින කිහිපය තුළ තොරතුරු එළි වූයේ මේ ඩයස්පෝරාවේ වැදගත් පිරිසක් ලංකා ආණ්ඩුව සමඟ ගනුදෙනුවක් අරඹනු ලැබ ඇති බවයි. මේ ගනුදෙනුව සාධාරණීයකරණය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ තර්කය වී ඇත්තේ උන්හිටිතැන් අහිමි වන්නියේ වෙසෙන තම ඥාති හිත මිත්‍රාදීන් පුනරුත්ථාපනය සඳහා ආණ්ඩුවේ අනුග්‍රහයෙන් තොර මාවතක් නැති බවය. මේ තර්කයේ යථාර්තය කුමක් ද? ආණ්ඩුව සමඟ එක් වී තම ඥාති හිතමිත්‍රාදීන්ට ඉන්න ගෙපැලක්, කෑමට පාන්පිටි, පරිප්පු ටිකක් ලබා දීමට කටයුතු යෙදීම ය. මේසඳහා අරමුදල් සම්පාදනය අරඹා ඇති බවද සැලය. එහි තේරුම දවැන්ත ආර්ථික වාසියක් ලංකාණ්ඩුවට සැලසීම ය. ආණ්ඩුව විසින් අනාථ කල තම ජනතාවට ආධාර කිරීමට සෘජු මාවතක් වෙනුවෙන් සටන අත් හැරි මොවුන් මෙසේ අද සැබෑ ලෙස සහන සලසන්නට යන්නේ තම ජනතාවට නොව ආණ්ඩුවටය. අහෝ, නිවට දේශපාලනයක මහිම! 1940 ගණන්වලදී සිංහල ධනපති පංතියේ අනුග්‍රහයෙන් ද, පසුව ගෝලීය ධනවාදයේ අනුග්‍රහයෙන්ද ජාතික අයිතීන් ලද හැකිය යන ස්ථාවරයේ සිටි මධ්‍යම පංතික දෙමළ නායකයන්ට මීට වඩා යහපත් ඉරණමක් නම් උරුම නොවීම ගැන ඉතිහාසය නම් වග කියනු නොමැත.

ඒ කෙසේ වෙතත් ඩයස්පෝරාවේ වැදගත් කොටසක් මෙසේ ලංකාණ්ඩුව සමඟ පෙළගැසීම ගෝලීය ධනවාදයේ විශ්වාසය නැවත ලංකාණ්ඩුව වෙත ලැබීමේ තවත් සාධකයක් වෙයි. මේ කපුකම සඳහා එරික් සොල්හයිම් හා යසුෂි අකාෂි වැනි පැරණි සාම ඒජන්තයන් වැදගත් මෙහෙයක් කළ බවට පැහැදිලි තොරතුරු පවතී.

අට වන පිටුවට.........

# ඉන්දියාවේ විශේෂ ආර්ථික කළාප (SEZ) සහ ස්වදේශිකයන්ගේ අරගලය




**අභයනාත බණ්ඩාර**

''අපේ ගමට පළමුව ඉඩම් මණින්නෝ ආවා. දෙවෙනුව කට කථා පැතිරුණා, ඉන්දියාවේ තිබෙන ලොකුම කොම්පැණිය වන ටාටා කොම්පැණිය අපේ දිස්ත්‍රික්කේ ලොකු වානේ කම්හලක් හදනවා කියලා. අන්තිමේදි ආණ්ඩුවේ නිලධාරීන් ඇවිත් චට්ටිස්ගාර් දිස්ත්‍රික්කේ ලෝහාන්දිගුඩා නම් අපේ ගමේ නුගත් ගොන්ද් ගෝත්‍රික ගොවියන්ට කිව්වා නුඹලාගේ ඉඩම් අතහරිනවා නම් හොඳට මුදල් ගෙවනවා කියලා, හොඳ රැකියා ලබා දෙනවා කියලා. හොඳ අනාගතයක් ඇති කරන බවටත් ඔවුන් පොරොන්දු වුණා'' යනුවෙන් චට්ටිස්ගාර් දිස්ත්‍රක්කේ ලෝහාන්දිගුඩා නම් ගමේ වැසියෙක් මාධ්‍යට පවසා තිබුණි.

ඔහු එසේ පවසා ඇත්තේ මේ දිනවල ඉන්දියාවේ සිදු වන මහා පරිමාණ ජනතා දේපොල මංකොල්ල කෑම සම්බන්ධයෙනි. ඉන්දියානු මධ්‍යම රජය විසින් ප්‍රාන්ත ආණ්ඩුද සම්බන්ධ කරගනිමින් මධ්‍යම සහ නැගෙනහිර ඉන්දියාවේ චට්ටිස්ගාර්, ජාර්කාන්ද්, ඔරිස්සා, ආන්ද්‍රා ප්‍රදේශ්, මහරාශ්ත්‍ර සහ නැගෙනහිර බෙංගාලයේ විශේෂ ආර්ථික කලාප - Special Economic Zone (SEZ) - ආරම්භ කරමින් ප්‍රදේශවාසීන් ගම්මානවලින් පළවා හරිමින් සිටී. එනිසා එම ප්‍රදේශයේ වසන විවිධ මුල්වාසී ගෝත්‍ර කණ්ඩායම් විසින් තම ප්‍රදේශ ආරක්ෂා කරගැනීම උදෙසා තමන්ගේම වූ හමුදා ගොඩනගමින් තම නිජභූමියේ කැලෑ සහ කඳුකරයේ සෑම තැනම මේ වන විට ක්‍රියාත්මකව සිටිති. මෙම ප්‍රදේශ නැවත ආණ්ඩුවේ අණසකට යටත් කර එම ප්‍රදේශයේ බහුලව පවත්නා බොක්සයිට් (ඇලුමිණියම් මිශ්‍රිත පස්), ගල් අඟුරු සහ යපස් ඇතුළු ස්වභාවික සම්පත් අත්පත් කරගැනීමට ඉන්දියානු සහ ජාත්‍යන්තර බහුජාතික සමාගම් අරමුණු කරති.

මෙම ප්‍රදේශවල ඉඩම් අක්කර ලක්ෂ ගණනින්, දස දහස් ගණනින් එම කොම්පැණිවලට පැවරීමත්, එම ප්‍රදේශවලින් පදිංචිකරුවන් පලවාහැරීමත් රජයේ ඊනියා සංවර්ධනයට අවශ්‍ය වී ඇත. එයට එරෙහිව පළමුව සාමකාමීවත්, දෙවෙනුව ප්‍රචණ්ඩ ලෙසත් ජනතාව විරෝධය දක්වනු ලබයි. ස්වදේශිකයන්ව එම ප්‍රදේශවලින් පලවා හැරීමට දහස් ගණනක සල්වා ජුදුම් ඇතුළු සන්නද්ධ කල්ලි ගණනාවක්ද (නිවාස ගිනි තැබීමට, පහර දීමට, සතුන් පැහැර ගැනීමට, මිනී මැරීමට සහ ස්ත්‍රීන් දූෂණය කිරීමට ඔවුනට නිතියෙන් බාධාවක් නොමැත. ඔවුහු රජයෙන් වැටුප් ලබන අතර, හමුදා පුහුණුව ලබා දුන් ගැමි තරුණයෝ වෙති.), 100,000 ක පමණ රජයේ හමුදාවක්ද යොදවා ඇත.

ඉහත ලෝහන්දිගුඩා ගමේ මෙසේද සිදු විය. ''වයස අවුරුදු 65 ක් විතර වන ගෝත්‍ර මුලිකයෙකු වන බන්ගා රාම් විහිලුවට වගේ ඇහුවා, ''සල්ලිවලින් මොනවද කරන්ට පුළුවන්'?' කියලා. ''අපේ මේ ගොවිතැනෙන් අපේ දරුවන්ට කන්න දෙන්න පුලුවන්නේ'' කියලත් ඔහු කිව්වා. ඒත් ඒකට නිලධාරීන් වචනයකින් වත් උත්තර දුන්නේ නෑ. බන්ගා රාම් අත්අඩංගුවට ගත්ත එකයි සිද්ධ වුණේ. දවස් 13 ක් හිරේ හිටපු ඔහු ඔහුගේ පුතාට කිව්වා අත්සන් කරපන් උන්ගේ වන්දි ලියවිල්ලට කියලා''.

ඒ ළඟපාතම පිහිටා ඇති චින්ද්ගෝන් ගමේ මෙසේ සිදු වූ බවට මාධ්‍ය වාර්තා කරයි. ඒ ගමේ වැසියෙක් වූ රජයේ පශුපාලන දෙපාර්තමේන්තුවේ මසකට රුපියල් 10,000ක වේතනයකට වැඩ කළ සුන්දර් කාශ්‍යප් මාධ්‍යට මෙසේ පවසා ඇත. ''මගේ ඉහළ නිලධාරීන් කිව්වා, නුඹගෙයි, සහෝදරයාගෙයි ඉඩම් අක්කර 5 බාර දීපන්, නැත්නම් නුඹේ ජොබ් එක අනතුරේ කියලා. ඉතින් අපි අත්සන් කළා.''

''ගම්මු කොහොමටත් තමන්ගේ ඉඩම් ඩැහැගැනීමට එරෙහිවයි හිටියේ. ඉන්දියාව පුරාම මෙසේ බලහත්කාරයෙන් ව්‍යාපාර සඳහා කාෂිකාර්මික ඉඩම් පැහැර ගනු ලබනවා. අපි මෙයට එරෙහිව කටයුතු කරනවා'' යනුවෙන් වැසියෝ පවසති.

බටහිර බෙංගාලයේ මිද්නපූර් දිස්ත්‍රික්කයේ සැල්බෝනිහි ජින්දාල් ස්ටීල් සපෙෂල් වර්ක්ස් ආර්ථික කලාපයේ -Jindal Steel Works Special Economic Zone (SEZ) - ආරම්භක උළෙල අවසන් වී නැවත පැමිණෙමින් සිටි බටහිර බෙංගාලයේ මහ ඇමති බුද්ධාඩෙබ් භට්ටාචාර්ජී සහ වානේ සහ කැනීම් පිළිබඳ ඇමති රාම් විල්ම් පස්වාන් ගේ වාහන පෙළපාලියට පසුගිය නොවැම්බර් 12 දින එල්ල කළ මහා බෝම්බ ප්‍රහාරයකින් ජන විරෝධය සන්නද්ධව මතුපිටට පැමිණිනි.

බලෙන් රජයට පවරා ගත් අක්කර 4,500 ක්ද, ජින්දාල් ඉඩම් හිමියන් ගෙන් සෘජුවම මුදල් ගෙවා ලබා ගන්නා ලද අක්කර 500 ක්ද ඇතුළුව අක්කර 5000 ක් මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගැණිනි. වාර්තා වන ආකාරයට මෙම භූමියෙන් විශාල ප්‍රමාණයක් රජය විසින් ස්වදේශික ජනතාව වෙනුවෙන් කලින් වෙන් කරනු ලැබූ සහ වනයට ප්‍රේරක කලාප (Buffer Zone) වශයෙන් පැවතුනු ඒවා වේ. තත්වය එසේ වුවද ඇත්ත වශයෙන් මෙම ඉඩම් වානේ කර්මාන්තය සඳහා පසුගිය සැප්තැම්බර් සිට ජින්දාල් කොම්පැණියට ලබා දී ඇත. පරිසර තක්සේරු වාර්ථාද නොසලකා, පවතින නීති පවා නොසලකා රජය විසින් මෙම ඉඩම් කොම්පැණියට පවරාදෙනු ලැබීය. රජයට SEZ නිසා මෙම වනයෙහි සිදුවන විනාශයන් සම්බන්ධයෙන් කිසිම සිත් තැවුලක් නොමැත. ගෝත්‍රික ජනයා තම භූමිවලින් එළවා දැමීම නිසා ඔවුන්ගේ ජීවන පැවැත්ම පවා අනතුරට පත්වීම පිළිබඳවද තැකීමක් නොමැත.

තම ඉඩම් පවරා ගැනීමට එරෙහිව ධර්මපූර් ගම්මානයේ පැවැත් වූ පොලිස් භීෂණයට

අට වන පිටුවට.........